**5 ශ්‍රේණිය - සිංහල**

**දෙවන වාරය- සිසු සටහන 21**

**<u>ඔවුහු යෙදුනු වර්තමාන කාල වාක්‍ය ලිවීම</u>**

තිසාරි සහ මනුති හොඳ මිතුරියෝ ය. ඔවුහු විනෝදාංශය සඳහා පොත් කියවති. පුවත්පත් කියවති. ඒ සඳහා ඔවුහු පුස්තකාලය භාවිත කරති. ඔවුහු පොත් කියවීම ඉතා අගය කොට සලකති.

අරිත සහ මනුක හොඳ මිතුරෝ ය. ඔවුහු විනෝදාංශය සඳහා චිත්‍ර අඳිති. ඔවුහු පරිසරයේ සොඳුරු දසුන් ඇති තැන් කරා පිය නඟති. එසේ ගොස් ඒ දසුන් සුන්දර ලෙස සිතුවමට නඟති. අනතුරු ව ඔවුහු එම සිතුවම් වර්ණ ගන්වති.

තිසාරි, මනුති සහ අරිත හොඳ මිතුරු-මිතුරියෝ ය. ඔවුහු විනෝදාංශය සඳහා කවි ලියති. ඔවුහු බොහෝ කවි පොත් කියවති. ලංකාවේ කවීන්ගේ මෙන් ම විදේශීය කවීන්ගේ නිර්මාණ ද ඔවුහු පරිශීලනය කරති. කවි නිර්මාණය ආස්වාදජනක බව ඔවුහු පවසති.

➢ **ඡේදයේ සඳහන් කරුණු ගොනුකර ලියන්න**

**තිසාරි සහ මනුති**

තිසාරි සහ මනුති හොඳ මිතුරියෝ ය.

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

**අරිත සහ මනුක**

අරිත සහ මනුක හොඳ මිතුරෝ ය.

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

**තිසාරි, මනුති සහ අරිත**

තිසාරි, මනුති සහ අරිත හොඳ මිතුරු මිතුරියෝ ය.

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

'ඔවුහු' යන පදය යොදා වාක්‍ය ගොඩනඟා ලියන්න.

1. දම්සාරි සහ ශනෙත් සමඟියෙන් සිටිති.

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

2. පසන්, සහන්, චමත් ක්‍රීඩා පුහුණු වීම් කටයුතු සිදු කරති.

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

3. පැහැසරණී, සිතුමිණී සහ දිනෙත් දක්ෂ ලෙස පන්තියේ වැඩ කරති.

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

4. රවිඳු, පවන් සහ විහඟි ගුවන්විදුලි නාට්‍යයකට සවන් දෙති.

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

5. කවීෂා සහ මලීෂා උදෑසනින් ම අවදි ව පිරිසිදු ජලය පානය කරති.

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .